# පළමු වාර පරීක්ෂණය - 2012
## බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය I | කාලය :- පැ.1 යි. |
|---|---|---|

නම :- .................................................... ඇ.අංකය :- ........................ පංතිය :- ...........

- **පහත දැක්වෙන 1 - 3 දක්වා වාක්‍යයන්හි යටින් ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

1. සිංහලයන්ගේ හුඹස්බිය පලවා හැරීමේලා මූලිකයා වූයේ අනගාරික ධර්මපාලතුමාය.

   (i) මරබිය (ii) පුහුබිය (iii) අස්ථානබිය (iv) සතුරුබිය

2. මාර්ග සංවර්ධනය සඳහා **තරුණ සමිතිය** ඉදිරිපත් කළ වාර්තාව හමස් පෙට්ටියට දමා ඇතැයි කියවේ.

   (i) අනුමතකොට (ii) ප්‍රතික්ෂේප කොට
   (iii) සාකච්ඡා නොකොට (iv) විවාදයට භාජනය කොට

3. අතපල්ලෙන් වැටුණු පිරිසක් සේ සලකා ඔවුන් ගැන කතා බහා කිරීම අනුමත කළ හැකිද?

   (i) කාත් කවුරුවත් නැති (ii) අත් පා දුබල
   (iii) පිරිසෙන් කොන් වූ (iv) අතපය නොසෙල්වන

- **අංක 4 - 8 තෙක් ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැන සඳහා වඩාත් සුදුසු පදය තෝරන්න.**

4. තමාට උසස් වර්ගයේ කමිසයක් මිල දී ගෙන දෙන්නැයි පුතා මවට නිතරම ................................ කළේය.

   (i) මැසිවිලි (ii) ඇවිටිලි (iii) කෙනෙහිලි (iv) ගෙරවිලි

5. නව විලාසිතා වැළඳ ගැනීම නූතන යුගයට පමණක් ................................ වූ ලක්ෂණයක් නොවේ.

   (i) පරිණාම (ii) ජනනය (iii) ආවේණික (iv) පරිබාහිර

6. අපේ රටේ හිටි ................................ ලේඛකයෙකු වූ සෙනරත් පරණවිතාන මහතා ශ්‍රේෂ්ඨ පුරාවිද්‍යාඥයෙකි.

   (i) කාර්යක්ෂම (ii) චතුර (iii) විදග්ධ (iv) චිරන්තන

7. අබාධිතයාට රෝද පුටුවක් පරිත්‍යාග කරමි'යි ................................ එදා වූ පොරොන්දු ඉෂ්ට කිරීමට එය අද ගෙනාවේ.

   (i) මම (ii) මා (iii) මා විසින් (iv) මම විසින්

8. ශේක්ෂ්පියර් විසින් සුප්‍රසිද්ධ නාට්‍ය හතක් ........................................ විචාරකයන් පවසති.

(i) ලියුවෝයැයි (ii) ලියුවේයැයි
(iii) ලියූහයි (iv) ලියවිණැයි

9. මුලින් දී ඇති පදයට අර්ථයෙන් බොහෝ දුරට සමාන අර්ථ දෙන වරණය තෝරන්න.

(i) ග්‍රන්ථය - ග්‍රන්ථීය (ii) ආරම්භය - ප්‍රාරම්භය
(iii) පහුර - පවුර (iv) සංත්‍රාසය - සංවේගය

10. මුලින් දී ඇති පදයේ විරුද්ධාර්ථය ඇති වරණය තෝරන්න.

(i) ආස්වාදය - ආනිශංසය (ii) සංවර්ධනය - නිෂේධනය
(iii) ශිථිල - දෘඪ (iv) උත්තේජනය - උත්ථානය

11. මුලින් දැක්වෙන ව්‍යාකරණ විධියට අයත් නොවන උදාහරණයක් දී ඇති වරණය තෝරන්න.

(i) තද්ධිත - රසවත්, නාගරික, කළටි, සුපුරිසිදු
(ii) ක්‍රියා - බමයි, බලන, නිදයි, වපුල
(iii) නාම - ඡායාව, සියපත්, පඬුර, නරසී
(iv) නිපාත - නමුත්, සඳහා, පිණිස, ඉක්බිති

12. ඈත අතීතයේ සිටම අඛණ්ඩව පැවත එන චාරිත්‍ර වාරිත්‍ර රැක ගැනීම අපේ වගකීමයි.

(i) සදාතනික (ii) චිරාගත (iii) සම්භාවනීය (iv) අවේණික

13. උන්වහන්සේ පමණ මෙතකැයි දැක්විය නොහැකි කරුණාවෙන් යුක්ත වූ සේක.

(i) අපිරිමිත (ii) විපරීත (iii) අපරාජිත (iv) පරිමිත

14. අනතුරකට ලක්වී සිටි රියදුරා සැත්කම් කෙරෙන කාමරයට ගෙන යන ලදී.

(i) චිකිත්සාගාරයට (ii) වෛද්‍යාගාරයට
(iii) පර්යේෂණාගාරයට (iv) ශල්‍යාගාරයට

- **අංක 15 - 16 තෙක් ඇති ප්‍රශ්නවල සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.**

15. (i) විස්මය, පුස්තකාලය, විශ්වාසය, ප්‍රදර්ශනය
(ii) විශ්ලේෂණය, ශ්‍රවණාගාරය, පර්යේෂනය, ජලාපවාහණය
(iii) නිශ්කලංක, නිශ්ශබ්ද, සංගායණාව, තීරණය
(iv) සමස්ත, ශිෂ්ඨාචාරය, කණිෂ්ඨ, ගවේෂණය

16. (i) අබිවාදනය, නිශ්ක්‍රීය, දෘශ්‍ය, ප්‍රශංසාව
(ii) ස්වයංපෝෂණය, සැණකෙළිය, තාක්ෂණය, පරිභ්‍රමණය
(iii) ස්ථූප, වත් පිළිවෙත්, පෞරාණික, මහෝපාධ්‍යය
(iv) නීත්‍යානුකුල, පරිගණක, ශ්‍රේෂ්ඨ, ප්‍රස්ථාරය

17. අකාරාදී පිළිවෙලට නම් යෙදී ඇති වරණය තෝරන්න.

(i) හංස සන්දේශය, අමාවතුර, දළදා සිරිත, පූජාවලිය
(ii) ගිරා සන්දේශය, බුත්සරණ, බුදුගුණාලංකාරය, සඳ කිඳුරු ජාතකය
(iii) මඩොල්දූව, විජයබා කොල්ලය, රන්මුතු දූව, ගම්පෙරළිය
(iv) කාව්‍යශේඛරය, බෝධිවංශය, ජාතක පොත, ධර්ම ප්‍රදීපිකාව

- **අංක 18 - 22 තෙක් ඇති ප්‍රශ්නවල ඇති හිස්තැන සඳහා ව්‍යාකරණානුකූලව වරණය තෝරන්න.**

18. නාහිමිපාණෝ උත්සවය සඳහා පැමිණ සිටි පිරිස පළමුකොට පංචශීලයෙහි ..............................

(i) පිහිටවූහ. (ii) පිහිටුවිය. (iii) පිහිටුවයි. (iv) පිහිටුවේය.

19. කැළණි නදී තොමෝ සමනල කන්ද මුදුනේ සිට සමුද්‍රය කරා ගලා ..............................

(i) යන ලදී. (ii) යති. (iii) ගියති. (iv) ගියාය.

20. මම ගෙදර යාමට සූදානම් ..............................

(i) විය. (ii) වෙමි. (iii) වෙමු . (iv) වෙති.

21. නැගණියෝ සියල්ලන්ගේ නෙත් තෙත් කර පතිකුලයට ..............................

(i) පියනගයි. (ii) පිය නැගුවේය.
(iii) පිය නගති. (iv) පිය නගන ලදී

22. මහ නාහිමි විචිත්‍ර ධර්ම දේශනයක් ..............................

(i) දෙසුවේය. (ii) දෙසුවෝය. (iii) දෙසූහ. (iv) වදාළහ.

- **අංක 23 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයේ මුලින් යෙදී ඇති පදය නිවැරදිව විසන්ධිකොට ඇති වරණය තෝරන්න.**

23. අපරාජිත - අප + රාජිත, අ + පරාජිත, අපරා + ජිත
24. ප්‍රත්‍යුපකාර - ප්‍රති + උපකාර, ප්‍රත්‍ය + උපකාර, ප්‍රත් + උපකාර
25. සමාන්තර - සම + අන්තර, සමානා + අන්තර, සමාන + අන්තර

- **අංක 26 - 30 වන තෙක් ඇති එක් එක් ප්‍රශ්නයේ ඇතුළත් වාක්‍ය අතරින් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.**

26. (i) අභය භූමියේ කිසිකෙනෙක් නොසිටි බව නිළධාරීන් දැන සිටියහ.
(ii) දක්ෂ ඉංජිනේරුවකු වූ ඔහු තෙමසසකින් පාලම තනා නිම කළේය.
(iii) ගොවීන් විසින් රජයේ නිලධාරීන් විවේචනය කරන ලදහ.
(iv) අපි වැඩි දෙනා ඔහුගේ සංගීත පන්තියට සහභාගිවූවන් විමු.

27. (i) ඕ තොමෝ මිත්තණියන් දැක සතුටු වෙති.
(ii) පයින් යන්නෝ පදික වේදිකාවේ ගමන් කළ යුතුය.
(iii) ගොවීන් විසින් කුරුල්ලෝ එළවනු ලැබූහ
(iv) සියලුම ළමයින් පැයක දී මුළු පාසල් වත්තම ශුද්ධ කළහ.

28. (i) ව්‍යක්ත කථිකයා පිණිස අමතා චතුර කථාවක් පවත්වන ලදි.

(ii) සියළුම නවකතාකරුවන් භාෂා විශාරදයන් නොවෙති.

(iii) මම ලිපිකරුවෙකු විනා ලඝුලේඛකයෙක් නොවෙයි.

(iv) දෙවියෝ වැනි මිනිස්සු ද අප අතර ඇත.

29. (i) විභාගයෙන් සමත්වීම අප හැමගේ ප්‍රාර්ථනාවයි.

(ii) නිරායුධ සම්මේලනයට පෙරදිග රටවල් කිහිපයක් නියෝජනය වී තිබුණෝය.

(iii) පෘතුගීසීන් විසින් ඉතා කුඩා බිම් කොටසක් ඉල්ලූහ.

(iv) නායක ශිෂ්‍යයන් සහ ගුරුවරු සමඟ පැමිණි විදුහල්පතිතුමා මුලසුන හෙබවූහ.

30. (i) ශ්‍රී ලංකාවේ අනාගත පුරවැසියන් අපිය.

(ii) විදේශිකයෝ ලංකාවට පැමිණීමට කැමතිය.

(iii) මෙවර ජයග්‍රාහකයින් අනුරාධපුරයෙනි.

(iv) එළදෙනක මැරීම හින්දු සමාජයේ බලවත් වරදකි.

- ඉරි ඇඳි පදය කවර ව්‍යාකරණ වර්ගයට අයත්දැයි තෝරන්න.

31. භික්ෂූන් වහන්සේ පිරිස පංචශීලයෙහි පිහිට වූහ.

(i) විශේෂණ සමාස (ii) අන්‍යාර්ථ සමාස
(iii) දකාරාර්ථ සමාස (iv) අව්‍යය සමාස

32. කැහැටු බල්ලකු දැකීමෙන් මා තුළ මහත් අනුකම්පාවක් ඇති විය.

(i) නිපාත (ii) තද්ධිත (iii) නිපාත (iv) උපසර්ග

33. සුභාෂිතය අපේ පැරණි කියමන් හඳුන්වා දෙන කෘතියකි.

(i) සමාස (ii) තද්ධිත (iii) නිපාත (iv) උපසර්ග

34. මව දියණිය සමඟ නික්මුණාය.

(i) ක්‍රියා (ii) නාම (iii) නිපාත (iv) සන්ධි

35. යෝජනාව අසා විපක්ෂය ද එකඟ විය.

(i) තද්ධිත (ii) උපසර්ග (iii) නිපාත (iv) සමාස

- මුලින් දී ඇති කොටසේ අර්ථය දක්වෙන වරණය තෝරන්න.

36. ''සුවහසක් මල් පිපුණු - නිල් අඹර වගේ වියන''

(i) දහස් ගණනින් මල් මෝස්තරවලින් වියන පිරී පවතී.

(ii) නිදහස් ජීවිතය පිපුණු මලක් මෙන් හොබනේය.

(iii) තරු බැබළෙන අහස ඉහළින් ඇත.

(iv) අහසේ හිරු දහසක් පායා ඇත.

37. ''බොල්පිණි කඳුළු වගුරයි තුරුලිය පඳුරු''

(i) ගස් වැල්වලින් සනවූ පිනි බින්දු කඩා වැටේ.

(ii) ගස් වැල් සමූහය බොරුවට හඬන්නාක් වැනිය.

(iii) හිස් බව දකින ගස්වැල් ශෝකයට එක්වේ.

(iv) පිනිකැට සමූහය ගස්වැල් නහවයි.

38. ''පෘථිවියට ජීවය ලබාදුන් අබිරහස් වලට අපේ ස්තුතිය හිමිවේවා''

(i) විශ්වයේ ජීවය

(ii) ගරු මර්සලින් ජයකොඩි පියතුමා

(iii) සිරිලක කප්තුරු

(iv) නිර්මාණය හා විචාරය

39. ''අව්වට වැස්සට හුරු - හුරු මිනිසුන්ගේ දෑතේ විරියෙනි රටවල් නැගුනේ'' මෙම ගීතය රචනා කර ඇත්තේ

(i) සිරිල් සමරකෝන්

(ii) ගුණදාස අමරසේකර

(iii) රඹුකන සිද්ධාර්ථ හිමි

(iv) පල්ලේගම සොමරතන හිමි

40. ගෞරවාර්ථ බහුවචන නාම පදයක් උක්තය වශයෙන් යෙදී ඇති වරණය තෝරන්න.

(i) අයෙක් සොරකම්කොට සිර ගෙවල ලගිති.

(ii) මුව රළ බියවී දුවන්නට වන්හ.

(iii) දෙවියෝ අහසේ සැරිසරති.

(iv) මගේ දියණියෝ දක්ෂ ගායිකාවක් වෙති.

# පළමු වාර පරීක්ෂණය - 2012
## බප/ජය/කොට්ටාව උතුර ධර්මපාල විද්‍යාලය

| 11 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය II , III | කාලය :- පැ.2 යි |
|---|---|---|

නම :- .................................................. ඇ.අංකය :- ........................... පංතිය :- ............

II කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. (i) සිට (x) තෙක් ඇති සියළුම ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) වර්ණ මාලාවේ වර්ණ ප්‍රධාන කොටස් 02කට බෙදේ. ඒවා මොනවාද?

(ii) පහත දැක්වෙන අකුරු යොදා අර්ථවත් වචන ලියන්න. ඝ, ෆ

(iii) පහත සඳහන් සමාසවලට උදාහරණය බැගින් ලියන්න.

**ද්වන්ද්ව සමාසය, විශේෂණ සමාසය** 

(iv) මේ වාක්‍යය බහුවචනයට හරවා ලියන්න.

**වඳුරා ද මුවා ද කොවුලා ද සමගිව විසූහ.**

(v) පහත දැක්වෙන කමත් බසේ ව්‍යවහාරවලට අරුත් දක්වන්න.

**අම්බරුවෝ** මැඩුවන්

(vi) පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

**දෙමාපියෝ දරුවන් යහමග යවති.**

(vii) පහත සඳහන් පද සඳහා යෙදිය හැකි තනිපදය ලියන්න.

**පූර්ණ කාලයෙහි පැවති**

**හිතුමතයට තීරණ ගන්නා**

(viii) පහත සඳහන් පදවල නාම මූලය හා ප්‍රත්‍ය වෙන්කොට ලියන්න.

කොටි නාගරික

(ix) පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න.

**පලාපල** **අත්‍යුත්තම**

(x) පහත සඳහන් වාක්‍යවල රූපක උපුටා ලියන්න.

**අපි බුදුරජාණන් වහන්සේගේ පා පියුම් නමදිමු.**

**කුමරතුඟු මුනිඳස් පඬිරුවන සඳා සමරමු**

(ලකුණු - 10)

2. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු රචනයක් ලියන්න.

අ. ස්වභාවික විපත් පිළිබඳ පුවත්, ලොව බොහෝ රටවලින් නිතර අසන්නට ලැබේ. ශ්‍රී ලංකාවේ ද මෙබඳු සිදුවීම් ඇතිවේ. න්‍යෂ්ටික අත්හදා බැලීම් හා පාරිසරික ගැටලු ද මේ සඳහා හේතු වන්නට ඇත. ස්වභාවික විපත් අවම කර ගැනීමට යෝග්‍ය ක්‍රියාමාර්ග යෙදීම අප කාගේත් යුතුකමකි.

ආ. දේශීය සංස්කෘතිය හා බැඳුණු නිවැරදි ආහාර රටාවකට අනාදිමත් කාලයක සිට උරුමකම් කියූ අපි පහසුව හා කාලය ඉතිරි කර ගැනීමේ අවශ්‍යතාව නිසා මෙරට මෙන්ම පිටරට ද නිෂ්පාදිත කෘත්‍රිම ආහාරවලට ඇබ්බැහි වෙමින් සිටිමු. මෙමගින් ක්ෂණික ව මෙන් ම දීර්ඝ කාලීන ව ද අතුරු ප්‍රතිවිපාක විඳීමට ඉඩ ඇති බවට පළකෙරෙන මත ගැන ද නිතර අසන්නට ලැබේ. මෙබඳු කෘත්‍රිම ආහාරපාන පරිභෝජනයේ යෝග්‍යතාව විමසීමට ලක් විය යුතුය.

ඉ. වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර සම්බන්ධ කෙරෙමින් දියුණු මාර්ග පද්ධතියක් ඉදිවෙමින් පවතී. ඒ අතර කොළඹ - මාතර, කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ද වෙයි. මීට සමගාමීව ප්‍රාදේශීය මාර්ග ද සංවර්ධනය වෙමින් පවතී. දියුණු මාර්ග පැවතීම රටක සංවර්ධනය සඳහා බෙහෙවින් උපකාරී වේ.

ඊ. පැරණි ශ්‍රී ලාංකික සමාජය ගොඩනැගීමට මුල් වූයේ වාපි සංස්කෘතියයි. ස්වභාවික හා පාරිසරික වෙනස්වීම් මැනවින් හඳුනාගෙන වැව් ජලය උපයෝගී කොට ගෙන ගොවිතැනෙහි යෙදුණු අපේ මුතුන් මිත්තෝ මේ රට සහලින් ස්වයං පෝෂණය කළහ. ඔවුන් විසින් දායාද කරන ලද සංස්කෘතිය අප ලද වටිනා සම්පතකි.

(ලකුණු - 20)

3. පහත ඡේදය කියවා වචන 30 - 35 වනසේ සාරාංශ කරන්න. සාරාංශය අග වචන ගණන ලියන්න.

බාහිර බලවේග කෙරෙහි අවධානය යොමු කිරීම නිසා එම බලවේග තමාට රුචි පරිදි වෙනස් කොට ස්වභාව ධර්මයේ ස්වාමිත්වය ලැබීමට මිනිසා එක්තරා ඓතිහාසික අවස්ථාවක දී සමත්ව ඇති නමුත් ඔහු ස්වභාවධර්ම විෂයය ලෝක ධර්මතාවයෙන් සම්පූර්ණයෙන් නිදහස් කිරීමට තවදුරටත් සමත් නොවනු ඇත. මහ පොළොව තම කුමන ප්‍රාතිහාර්යයක් පෑමට වුවද පළමු කොට මිනිසා ජීවත් කරවන වාතස්කන්ධය, හිරු රැස් හා තෘණ සහිත මහ පොළොව පැවතිය යුතුය. මානව ආධ්‍යාත්මය මහ පොළවේ සරු පස මත මුල් බැසගෙන වැඩිය යුතුය. මනුෂ්‍ය චිත්ත සන්තානය අනෙක් බොහෝ ස්වභාවධර්මීය වස්තුන්ට වෙනස් වුව ද මහ පොළොව මත හිඳිනාතාක් භෞතික භාවයෙන් විමුක්තිය ලැබිය නොහැකිය.

(ලකුණු - 10)

## III කොටස

- පහත දී ඇති ප්‍රශ්න අතුරින් දෙකක් තෝරාගෙන පිළිතුරු ලියන්න.

4. හත්ත හත්තික සිටාණන්ගේ කතාව උපුටාගත් මුල්කෘතිය යුගය හා රචකයා සඳහන් කරමින් ශ්‍රාවක සිත් සතන් දන්දීම විෂයෙහි යොමුකිරීම කතාවේ අරමුණයි. උදාහරණ දෙමින් විමසන්න.

(ලකුණු - 10)

5. පියසේන ඇසූ ප්‍රශ්නයක් පද්‍ය පත්තිය රචනා කිරීමට පාදක කරගත් තේමාව, එහි කතුවරිය සඳහන් කරමින් පද්‍ය පත්තිය තුළින් පැහැදිලිවන සමාජ ගැටළුවේ ස්වභාවය උදාරහණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු - 10)

6. ස්වභාවික පරිසරයේ සංසිද්ධියක් පදනම් කරගෙන

   I. පරිසරයේ ඇතිවන වෙනස්වීම් චිත්‍රණය කිරීම

   II. එහි චමත්කාරය අත්දැකීම් ඔස්සේ ප්‍රති නිර්මාණය කිරීම

   වැස්ස පැදි පෙළේ සාර්ථකත්වයට හේතු වී ඇත එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු - 10)